# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2283/36 – 2022 ජූනි 09 වැනි බ්‍රහස්පතින්දා– 2022.06.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/170.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.28 දිනැති හා අංක 2116/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බණ්ඩාරගම, වීදාගම, රේරුකාන පාර, අංක 34 ඩී හි පදිංචි ඩී.ජේ.එම්.කුසුමාවතී මිය සහ මොරටුව, කටුබැද්ද, ගාලුපාර, අංක 615 හි පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.01.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මැයි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මාගේ අංකය: IR/COM/05/2017/170.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ඩී.ජේ.එම්.කුසුමාවතී මිය,
අංක.34ඩී, ෆේරුකාන පාර,
වීදාගම,
බණ්ඩාරගම.

නඩු අංකය: A /24/2019.

එදිරිව

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
අංක.615,
ගාලු පාර,
කටුබැද්ද, මොරටුව.

## ප්‍රදානය

කම්කරු හා වෘත්තිය පුහුණු සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියම්) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019 මාර්තු මස 14 දිනැති විශේෂයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

<u>ආරවුලට තුඩුදුන් කාරණය</u>

බේරුම්කරණයට මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උත්ගතවී ඇති කාර්මික ආරවුලට හේතුවී පවතින කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් ඒ.විමලවීර මහතා විසින් 2019 මාර්තු මස 06 වැනි දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

''ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මුදල් ලෙස සේවය කළ ඩී.ජේ.එම් කුසුමාවතී මිය සම්බන්ධයෙන් පැවති විනය පරීක්ෂණයෙන් අනතුරුව නැවත සේවයේ පිහිටුවීමේදී ඇයට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ''.

මෙම යොමුවට අනුව ආරවුලට අදාල පාර්ශවයන් වෙතින් ලිඛිත කරුණු ලබා ගැනීමෙන් අනතුරුව මෙකී නඩුව විභාගයට ගැනීමට තීරණය කරමින් 2019.08.15 දින නඩුව ආරම්භ කළ අතර සමථයක් තිබේ දැයි විමසීමේදී එදින වන විට සමථයක් නොමැති බව ප්‍රකාශ කළෙන් පසුව විභාගයට ගන්නා ලදී. ඒ අනුව එදින පැමිණිලිකාර පාර්ශයේ මූලික සාක්ෂි ලබා ගත් අතර වැඩිදුර මූලික සාක්ෂි සඳහා 2019.09.11 දිනට දින නියම කරන ලදී. එදින පැමිණිල්ලේ මූලික සාක්ෂි අවසන් කරන ලද බව ප්‍රකාශ කරන ලද අතර වගඋත්තරකාර පාර්ශවය සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුකරන ලදී. 2019.12.18 දින හරස් ප්‍රශ්න විමසීමට නියමිතව තිබුනද ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර ඇත්තේ තමන් විසින් වගඋත්තරකාර පාර්ශවයට සමථ යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවයි.ඒ අනුව වැඩිදුර විභාගය 2020.02.19 දිනට නියම කරන ලදී.

2020.02.19 දින නඩුව විභාගයට ගැනීමට නියමිතව තිබුනද ඉල්ලුම්කාරිය වෙනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ තමා අසනීප හෙයින් අධිකරණයට පැමිණීමට නොහැකි බවත්, කෙසේ වුවද තමන් සමථයට අදාල ලේඛන තොරතුරු දැනගැනීමේ පනතේ ප්‍රතිපාදන පරිදි ඉල්ලා සිටියද ප්‍රමාණවත් තොරතුරු නොලැබුනු හෙයින් වගඋත්තරකාර පාර්ශවයෙන් අදාල තොරතුරු ඉල්ලා ඇති බවත්, ඒ අනුව තවදුරටත් සමථයකට සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බවත්ය.

ඒ අනුව සමථය හෝ විභාගය 2020.03.19 දිනට නියම කළ අතර, ඉල්ලුම්කාරිය ප්‍රකාශ කළේ තමා අසනීප වූ බැවින් ඒ පිළිබඳව කටයුතු කිරීමට නොහැකි වූ බවත්, තවද දේශපාලන වශයෙන් සිදුවූ වෙනස්කම් මත ආයතනය සමග කටයුතු කරගැනීමට දුෂ්කර වූ බවත්ය. කෙසේ වුවද මෙදින වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුකර අවසන් කරන ලද අතර, මෙම

නඩුවේ මීලඟ විභාගය 2020.10.14 දිනට නියම කරන ලදී.

2021.04.07 වැනි දින දෙපාර්ශවය නැවත විභාගය කැඳවූ අතර එහිදී පළමු පාරශවය සමථ යෝජනාව දෙවන පාර්ශවයට ඉදිරිපත් කළ බව කියා සිටි අතර දෙවන පාරශවය කියා සිටියේ පාලක මණ්ඩලයට යොමු කර ඇති බවත්, පාලක මණ්ඩලය උපදෙස් ලබා දී ඇත්තේ සමථ යෝජනාවට අදාල වැටුප් ගණනය කර ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කළ යුතුව හැකි බවත්ය. ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශවය විසින් සමථයක් ලෙස තමන්ට ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයට සමථ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

2021.12.02 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කාරියගේ සමථ යෝජනාව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ පසු පහත පරිදි සමථයකට පත් කර ඇති බවයි:

1. නඩුව සමථයකට පත්කර ගැනීමක් වශයෙන් ඉල්ලුම්කාරියගේ හිඟ වැටුප්, ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා වශයෙන් රුපියල් පහළොස් ලක්ෂ හැත්තෑ අට දහස් හතලිස් නවයයි ශත විසිනවයක් (රු 15,78049.29) ලංකා බැංකුවේ ඉඩම ශාඛාවේ 2021.12.15 දිනැති අංක: 279890 චෙක්පතින් ඉල්ලුම්කාරියට ගෙවූ බවත්,

2. හිඟ පාරිතෝෂික වශයෙන් අංක 27989 දරන ලංකා බැංකුවේ ඉඩම ශාඛාවේ 2021.11.15 දිනැති චෙක්පතින් රුපියල් හැත්තෑ එක් දහස් අනූතුනක් (රු.71,093.00) ඉල්ලුම්කාරියට ගෙවූ බවත්, වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන ලද අතර එසේ සමථයකට පත් වූ බව අද දින ඉල්ලුම්කාරිය විසින් ද පිළිගන්නා ලදී.

මේ අනුව ඉහත පරිදි මෙම සමථය සිදු වූ බව ප්‍රකාශ කරමි.

එහෙයින් මෙම සමථය සාධාරණ හා යුක්ති සහගත වූත් එකක් බවට මම තීරණය කරමි.

**එච්.එම්.අනුලාවති,**
බේරුම්කරු.

2022 ජනවාරි මස 11 වැනි දින,

EOG 06-0091

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.